## 346 මා ප්‍රේම වූ

මා ප්‍රේම වූ දිව්‍ය හෘදයෙනී
දේව දයාවේ ලාංජනයෙනී
සර්ව ප්‍රසාද නිධානයෙනී
අනන්ත ජීවිත උල්පතෙනී

ආ ජේසුනී මා ජේසුනී ඔබගෙ ශ්‍රී හෘදයෙන්
කරුණා බරව අපගේ පාපයෙන් මුදනු මැනව

මෝක්ෂ හැර ඔබ අප නිසා
පක්ෂයෙන් මේ ලෝකයෙහි බැස්සා
යක්ෂයන්ගේ වික්‍රමයන් නසා
දුක්ෂ වින්දේ දාසයන් උදෙසා

ලෝ වැසියන් ප්‍රේම කරමින
කෝපයෙනුත් අප රකිමින
මොක් සැපත දෙන්ට සිත් වෙමින
බෝ වේදනා වින්දේ සතුටින